ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය I - 2012/13

පරිපාලන නීතිය - LWU 3311/4331

කාලය පැය එකයි.

---

දිනය - 2013 මාර්තු 05 වන දින වේලාව - ප.ව. 12.45- ප.ව.01.45 දක්වා

---

පහත ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

01. 2000 වාණිජ හා අපනයන පනත යටතේ වාණිජ සහ අපනයනය අමාත්‍යවරයාට වාණිජ හා අපනයන මණ්ඩලය පත් කිරීම සඳහා අධිකාරිත්වයක් තිබේ. මෙම මණ්ඩලයට රට තුළ වාණිජ සහ අපනයන කටයුතු විධිමත් කිරීම සඳහාත්, බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන අවශ්‍යතාවන් සපුරන ලද ඕනෑම පුද්ගලයකුට තොග වෙළඳ නිෂ්පාදනයන් අපනයනය කිරීම සඳහා වන බලපත්‍රයක් නිකුත් කිරීම සඳහාත් බලතල ඇත.

තමන් වෙත ඉදිරිපත් කරන ලද ඕනෑම අයදුම්පතක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසානාත්මක සහ තීරණාත්මක බවත් කිසිදු අධිකරණයකදී ප්‍රශ්න කළ නොහැකි වන බවත් පනත මගින් දක්වා තිබේ. රුවන් එළවළු සහ පළතුරු ගොවිපලක හිමිකරුවෙකි. ඔහු එළවළු සහ පළතුරු තොග අපනයනය කිරීම සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කළ ද නරක් වන සුළු භාණ්ඩ සඳහා බලපත්‍ර ලබා නොදෙන පදනම මත මණ්ඩලය විසින් එය ප්‍රතික්ෂේප කළේය.

රුවන් මණ්ඩලය වෙත අභියාචනය කරන ලද අතර ඔහු විසින් අපනයනය කරනු ලබන නිෂ්පාදනයන්හි මුළු වටිනාකමෙන් 10% ක බද්දක් ගෙවීමේ කොන්දේසියට යටත්ව අපනයනය සඳහා අනුමැතිය ලබාදීමට මණ්ඩලය එකඟ වේ. තම තීරණය අවසානාත්මක බව මණ්ඩලය තවදුරටත් දක්වා සිටින ලදී.

රුවන් මණ්ඩලයේ තීරණය අභියෝගයට ලක් කිරීමට අදහස් කරයි.

රුවන්ට උපදෙස් දෙන්න.

ඔබ විසින් එංගලන්තයේ සහ ශ්‍රී ලංකාවේ අධිකරණ තීන්දු සාකච්ඡා කිරීම අපේක්ෂා කෙරේ.

(ලකුණු 20)

- හිමිකම් ඇවිරිණි. -

**THE OPEN UNIVERSITY OF SRI LANKA**

**LLB DEGREE PROGRAMME – LEVEL 5**

**1ST CONTINUOUS ASSESSMENT TEST 2012/2013**

**LWU3311/4331 – ADMINSTRATIVE LAW**

**DURATION: 01 HOUR**

**DATE:05th March 2013** **TIME: 12.45 p.m. – 1 .45 p.m.**

**Answer the question given below.**

The Minister of Trade & Export has the authority under the Trade & Export Act 2000 to appoint a Trade & Export Board. This Board has the power to regulate the Trade & Export in the country, and to issue licenses in respect of export of any wholesale product to any person who satisfies the requirements to obtain such a license. The Act provides that the determination of the Board on any application made to them shall be final and conclusive and shall not be called in question in any court of law.

Ruwan owns a vegetable and fruit farm. He applied for a license for the wholesale export of vegetable and fruit but it was refused by the Board on the ground that no license could be issued for perishable items. Ruwan appealed the Board which then agreed to grant permission to export his products subject to the condition that Ruwan should pay a 10% tax of the total value of the product exported by him. The Board further stated that its decision was final.

Ruwan wishes to challenge the decision of the Board.

Advise Ruwan. You are expected to discuss the U.K. and Sri Lankan judicial decisions.

(20 marks)

*- Copyrights reserved -*